සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: චිත්‍ර | පත්‍රය / வினாத்தாள் / Paper: 1 | පැය / மணித்தியாலம் / Hours: 1 |

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම:-..................................................................................පන්තිය:- 11- ......

- **සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **01** සිට **05** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



01.මෙම වාස්තු විද්‍යා නිර්මාණය .........................................................................අයත් ගොඩනැගිලි සංකීර්ණයේ පිහිටා ඇත.

02.මෙය.....................................................යුගයේ විමලධර්මසූරිය රජ සමයේ ඉදිකර ඇති බව සඳහන්වේ.

03.මෙම අපූර්ව නිර්මාණය.............................................................................නමින් හැඳින්වේ.

04.මෙය නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ...............................................................ශිල්පියාට ය.

05.මෙම ආගමික ගොඩනැගිලි සංකීර්ණයේ දක්නට ලැබෙන සඳකඩ පහණ.........................හැඩයක් ගනියි.

- **අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06. ඉස්ලාම් ආගමික දේවස්ථානවල ශිඛරය දෙපස ඇති උස් වූ වාස්තු විද්‍යාත්මක අංගය කුමන නමකින් හැඳින්වේ ද? ..........................................................................................................

07. කැලණි දාගැබේ ගර්භයේ වර්තමාන හැඩය කුමක් ද?.......................................................................................

08. "තේවාරම්" නමැති ස්තෝත්‍ර ලියා,මංගල ඇඳුමෙන් සැරසී, දේවාලයෙන් දේවාලයට යමින් ගායනා කරන්නා දැක්වෙන ප්‍රතිමාව කුමන නමකින් හැඳින්වේ ද?..........................................................................

09. සට්ටනාදර් ශිව දේවාලයේ දැකිය හැකි සුදු අත් සහිත පූජකයකු ගණපතිට පූජා පවත්වන සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද?...........................................................................................

10.ජේසුස් වහන්සේගේ අප්‍රාණික සිරුර මරිය මව්තුමිය විසින් උකුලෙහි හොවාගෙන සිටින අයුරු දැක්වෙන ප්‍රතිමාව ප්‍රදර්ශනයට තබා ඇත්තේ කුමන ස්ථානයක ද?.........................................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

11. එම්.සාර්ලිස් ශිල්පියාගේ බෞද්ධ සිතුවම් නිර්මාණ, විහාර සිතුවම් හා ................................................ සිතුවම් ලෙස කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය.

12. හින්දු ආගමික මූර්තියක් වූ නටරාජ, ප්‍රතිමාව ශිව හෙවත් ඊශ්වර දෙවියන්ගේ.............................................. නර්තන විලාශය පෙන්නුම් කරයි.

13. සාංචි ස්තූපයේ හර්මිකාව මැද මුදුන උල් වූ අටපට්ටම් සෙල්මුවා ටැඹක් පිහිටුවා ඇති අතර එය "යූපය" හෙවත්..................................................................................................යනුවෙන් ද හඳුන්වයි.

14. පොළොන්නරුවේ දළදා මලුව යයි සැලකෙන භූමියේ නිශ්ශංකමල්ල රජු විසින් ඉදිකරන ලද වෘත්තාකාර ගොඩනැගිල්ල ................................................................... නමින් හැඳින් වේ.

15. ඊජිප්තු කලා නිර්මාණ අතර දැකිය හැකි නෙෆර්ට්ටිටි අධිරාජනියගේ රුව ........................................ යුගයට අයත් යැයි විශ්වාස කෙරේ.

- අංක **16** සිට **21** තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. අජන්තාවේ ලෙන් සිතුවම් අතරින් හමුවන පත්මපාණී බෝසත් රූපයට සමාන සිතුවමක් දැකිය හැකි වන්නේ,
   I. පොළොන්නරු පොත්ගුල් විහාරයේ ය.
   II. ගල් විහාරයේ විද්‍යාධර ගුහාවේ ය.
   III. තිවංක පිළිම ගෙයි අන්තරාලයේ ය.
   IV. ථූපාරාම පිළිමගෙයි ගර්භයේ ය.

17. ගම්පොළ යුගයේ ඉදි කර ඇති ලංකාතිලක විහාරය,
   I. බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථානයක් ලෙස ඉදිකරන ලද්දකි.
   II. සුවිසල් ගල්තලාවක් මත ඉදිකර ඇති ගොඩනැගිල්ලකි.
   III. දකුණු ඉන්දිය වාස්තු විද්‍යා ලක්ෂණ අනුව ඉදිකරන ලද්දකි.
   IV. ස්ථපතිරායර් ශිල්පියාගේ සැලසුමකට අනුව ඉදිකරන ලද්දකි.

18. නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනයේ දී අපේක්ෂා කෙරෙනුයේ,
   I. ද්‍රව්‍ය සමූහය මූලික සිද්ධාන්ත භාවිත කරමින් ගති ලක්ෂණ මතුවන සේ ඇඳ වර්ණ කිරීමයි.
   II. මූලික සිද්ධාන්ත භාවිත කර නිර්මාණයකර, දීප්තිමත්ව වර්ණ කිරීමයි.
   III. එක් එක් වස්තූන් වෙන වෙනම ඇඳ ඒවායේ වයනය දැක්වෙන අයුරින් වර්ණ කිරීමයි.
   IV. ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ ඇඳ වර්ණ කිරීමයි.

19. රෙදිපිළි මුද්‍රණය සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කිරීමේ දී වඩාත් සැලකිලිමත් විය යුත්තේ,

I. නිර්මාණශීලී හැඩතල භාවිතය හා විසංගත වර්ණ යෙදීමයි.
II. සරල හැඩතල හා සීමිත වර්ණ සංගතව භාවිත කිරීමයි.
III. නිර්මිත සැරසිලි ඒකකය සෙසු කොටස් සමඟ සෑම පැත්තකින් ම සම්බන්ධ කිරීමයි.
IV. කොටු රටාවක් භාවිතකර එකම පැත්තකට විහිදී යන සේ සැරසිල්ල ඇඳ වර්ණ කිරීමයි.

20. ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් ලාංඡනයක් නිර්මාණය කිරීමේදී වඩාත් අවධානය යොමුකළ යුත්තේ,

I. දීප්තිමත් වර්ණ යෙදීමටයි.
II. පැහැදිලි හා සරළ බව දැක්වීමටයි.
III. සැලසුමේ සංකීර්ණ බව දැක්වීමටයි.
IV. රූප සටහන් හා හැඩතල විස්තරාත්මකව දැක්වීමටයි.

- අංක **21** සිට **25** තෙක් දී ඇති රූපසටහන්වලට **කිසියම් සබඳතාවක්** දක්වන රූපසටහන, ඒ ඉදිරියේ ඇති **A,B,C,D,E** යන රූප සටහන් අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

21.  (..................)  A

22.  (..................)  B

23.  (..................)  C

24.  (..................)  D

25.  (..................)  E

• අංක 26 සිට 30 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

26. සංඛ නිධි :- ..................................................................................................

..................................................................................................

27. ටෙම්පරා :- ..................................................................................................

..................................................................................................

28. ලියනාඩෝ ඩාවින්චි :- ..................................................................................................

..................................................................................................

29. පායම් පැහිම :- ..................................................................................................

..................................................................................................

30. පර්යාවලෝකය :- ..................................................................................................

..................................................................................................

• ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

31. F අක්ෂරයෙන් දැක්වෙන බුද්ධ ප්‍රතිමාව කුමන කලා සම්ප්‍රදායයකට අයත්වේ ද?

..................................................................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන කැටයම දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?

..................................................................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන රජ පවුල නම් වූ මූර්තිය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

..................................................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන තෙල්සායම් මාධ්‍ය සිත්තම නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා කවුද?

..................................................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන කවපෙත්ත විසිකරන්නා නමැති පිළිරුව නිර්මාණය කර ඇති මාධ්‍ය කුමක් ද?

..................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම 2021

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: III | කාලය / மணித்தியாலம் / Hours: 2 යි. |

සැලකිය යුතුය.

- චිත්‍රය ඇඳීමට පෙර ඔබගේ උත්තර පත්‍රයේ පිටුපස ඔබේ විභාග අංකය හා තෝරාගන්නා ලද මාතෘකාව පැහැදිලිව සටහන් කරන්න.
- ඔබ අඳින ලද චිත්‍රය ශාලාධිපතිට භාරදෙන විට හොඳින් වියළී තිබිය යුතුය.
- චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැක.
- දිය සායම්, පැස්ටල්, පෝස්ටර් සායම් ආදී අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැක.

---

"අ", "ආ" හා "ඉ" කොටස්වලින් එක් කොටසක් තෝරාගෙන එයින් එක මාතෘකාවක් පමණක් ඇඳ වර්ණ කරන්න.

"අ" කොටස - චිත්‍ර සංරචනය

(1) "වැල්ලට ඔරු ඇවිල්ලා"
(2) බස් හෝ දුම්රිය නැවතුමක සිරි
(3) දිය කෙළින අලි ඇතුන්
(4) පහත සඳහන් කවිය අර්ථවත් කරමින් වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

"කදු බැවුම් දං - බෝවිටි පඳුරු තලා
පහළට ඇදී පරමල් පෙති ඉවත නොලා
කළදෝ දියෙන් පොගවා රන් පුලින තලා
සංගීතවත් වී යම් ඉදිරියට ගලා

(10,11 සිංහල සාහිත්‍ය සංග්‍රහ - (ගංගාවේ ගීතය පාඩම - 1 වන කවිය)

"ආ" කොටස - මෝස්තර නිර්මාණය

(5) සත්ත්ව රූප ඇසුරින් සමචතුරස්‍රාකාර කුෂන් කවරයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
(6) කාටූන් චරිත ඇසුරෙන් ළමා ඇඳුමක් මැසීමට භාවිත කරන රෙද්දකට උචිත ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
(7) අෂ්ටාකාර හැඩැති දැව මේසයක මුහුණතේ කැටයම් කිරීම සඳහා සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඒකක භාවිත කර සුදුසු නිර්මාණයක් කරන්න.

"ඉ" කොටස - ග්‍රැෆික් මොස්තර

(8) යොවුන් ලේඛකයෙකු විසින් රචිත "ජන කලා" නැමැති පොත සඳහා සුදුසු පිටකවරයක් නිර්මාණය කරන්න.
(9) දේශීය ඖෂධ භාවිතයෙන් සකසන සබන් වර්ගයක් ඇසිරීම සඳහා සුදුසු දවටනයක් නිර්මාණය කරන්න.
(10) "වර්ණ" නමැති ළමා චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(ලකුණු 30)

**පිළිතුරු පත්‍රය - චිත්‍ර කලාව1**

1. දළදා මාලිගාවට 2.මහනුවර 3.පත්තිරිප්පුව 4.දේවේන්ද්‍ර මූලාචාරී 5.ත්‍රිකෝණාකාර

6. මිනාර් / මිනරෙට් 7.ධාන්‍යාකාර 8.සුන්දරමූර්ති ස්වාමි 9. තාවඩි මුත්තු තුරෙයිසාමි

10.රෝමයේ ශාන්ත පීතර් දෙව් මැදුර 11. ලිතෝ මුද්‍රණ 12.තාණ්ඩව 13.යෂ්ටිය 14.වටදාගෙය

15.අමර්ණ යුගය/ නව රාජධානි 16.iii. 17.iv 18.i. 19.iii 20.ii

21. D. 22. A. 23. C. 24. E 25. B

26.අභයගිරි පිවිසුම් දොරටුව ඉදිරිපිට සංඛ නිධි බහිරව රුව සහිත මුරගලක් දක්නට ඇත.

27.වියළි බදාමය මත බන්දන මාධ්‍යයක්(මැලියම්) සමග මිශ්‍ර කර ගන්නා ලද වර්ණවලින් ඇඳීමේ ක්‍රමය මෙනමින් හැඳින්වේ..

28.මොනාලිසා, අන්තිම රාත්‍රී භෝජනය යන සිතුවම් මෙම ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.
29.වෙස්මුහුණු කර්මාන්තයේදී ලී කොටයේ ඇති ගැට සහිත තැන් කපා පැතලි ලෙස සකස් කිරීමයි.

30.ළඟට පෙනෙන වස්තූන් විශාලවත් එය දුරට පෙනෙන විට කුඩාවට පෙනීමේ චිත්‍රමය සිද්ධාන්තය මෙනමින් හැඳින්වේ.

31. ගුප්ත 32. කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහල ඉදිරිපිට බිත්තියේ
33. හෙන්රි මුවර් 34. කේ.කනකසභාපති 35. කිරිගරුඬ

36. ජී.එස්.ප්‍රනාන්දු ශිල්පියා විසින් අඳින ලද සිතුවමකි.

37. මෙම සිතුවම "උළු පෝරණුව" යන නමින් හැඳින්වේ.

38. තලය මත රූප සංරචනය කිරීමේ දී පෙරබිම,මැදබිම,පසුබිම, මත රූප පිහිටුවමින් චිත්‍රයේ ගැඹුර හා පර්යාවලෝක ලක්ෂණ සහිත ව නිරූපනය කර ඇත.

39. මෙම සිතුවම යුරෝපීය ස්වභාවිකවාදී ශෛලිය ලක්ෂණ අනුව නිර්මාණය කර ඇත

40. කඩදාසිය මත දීප්තිමත් වර්ණමාලාවක් ත්‍රිමාන ලක්ෂණ සහිත ව දියසායම් පදාස ක්‍රමයට ප්‍රකාශනාත්මකව ඉදිරිපත් කිරීම තුළින් ශිල්පියා සතු කුසලතාව මැනවින් පිළිඹිඹු කෙරේ.

(ලකුණු-40×1=40යි.)

***